# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1912/22 – 2015 අප්‍රේල් 29 වැනි බදාදා – 2015.04.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39අ(1) වැනි වගන්තිය යටතේ නියමය

2013 ජුනි මස 21 වැනි දින අංක 1815/21 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි (460 වන අධිකාරිය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2013 අංක 185 දරන ආඥාවේ කැබලි අක්ෂර 'ඒ' ලෙස සඳහන් ඉඩම් කොටස රජය වෙත සම්පූර්ණයෙන් ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39අ(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් අමාත්‍ය මුණසිංහ කාරියවසම් අප්පුහාමිලාගේ දොන් සෝමදාස ගුණවර්ධන වන මම, මෙහි 1 වන උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4/3/10/2012/එල්ආර්බී/277.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: ත්‍රිප්‍රාලේ/1/8/3/41අත්.
2015 අප්‍රේල් මස 29 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

1 වන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කිරුළ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ (කොට්ඨාස අංක 41, කිරුළ, කොළඹ මහ නගර සභා සීමාව තුළ) නාරාහේන්පිට ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක කො 9437 සහ 2014.05.02 දිනැති මූලික පිඹුරේ සවිස්තරව පෙන්නුම් කර ඇති පහත සඳහන් නම්වලින් සහ ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක 01 – ඇළඳූව – ප්‍රමාණය: හෙක්. 0.1937 ක් පමණ**
උතුරට: අගල සහ මාර්ගය; නැගෙනහිරට: හීන් ඇළ පාර; දකුණට: හීන් ඇළ පාර, ඉඩමේ නම සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි ඉඩම; බටහිරට: ඉඩමේ නම සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි ඉඩම සහ අගල.

05 – 337

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2015 අංක 87 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/11/2013/එන්ආර්ඩී/673.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: ඩීඅයිකේ/එල්ඒඑන්/02/30/42.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් අමාත්‍ය මුණසිංහ කාරියවසම් අප්පුහාමිලාගේ දොන් සෝමදාස ගුණවර්ධන වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන,
ඉඩම් අමාත්‍ය.

2015 අප්‍රේල් මස 27 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, දික්වැල්ල.

2. **ඉඩමේ විස්තරය.**– දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැල්ලබඩපත්තුව නැගෙනහිර සුළු කොට්ඨාසයේ, බඹරැන්ද මධ්‍යම ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් සකස් කරන ලද අංක එම්ආර්/ඩීකේඩබ්ලිව්/2014/253 හා 2014.10.30 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් කැබලි අක්ෂර 'ඒ' සහ 'බී' යනුවෙන් දක්වා ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.0528 ක් පමණ වන පහත සඳහන් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – වැලිපනේවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0288**
උතුරට: මලවි ආරච්චිගේ විජේසේකර හිමිකම් කියන වැලිපනේවත්ත; නැගෙනහිරට: නම්බු හේවා තිලකසිරි හිමිකම් කියන සෙංකුන්ඩගෙකැල්ල, කැබලි අක්ෂර බී, සෙංකුන්ඩගෙකැල්ල සහ දුම්රිය මාර්ගය සඳහා රජයට අත්කර ගන්නා ලද සෙංකුන්ඩගෙකැල්ල සහ වැලිපනේවත්ත; දකුණට: දුම්රිය මාර්ගය සඳහා රජයට අත්කර ගන්නා ලද වැලිපනේවත්ත සහ මාර්ගය (ප්‍රා.ස.); බටහිරට: මාර්ගය (ප්‍රා.ස.) සහ මලවි ආරච්චිගේ විජේසේකර හිමිකම් කියන වැලිපනේවත්ත.

02. **කැබලි අක්ෂර 'බී' – සෙංකුන්ඩගෙකැල්ල – ප්‍රමාණය: හෙක්. 0.0240**
උතුරට: නම්බු හේවා තිලකසිරි හිමිකම් කියන සෙංකුන්ඩගෙකැල්ල; නැගෙනහිරට: මාර්ගය සහ දුම්රිය මාර්ගය සඳහා රජයට අත්කර ගන්නා ලද සෙංකුන්ඩගෙකැල්ල; දකුණට: දුම්රිය මාර්ගය සඳහා රජයට අත්කර ගන්නා ලද සෙංකුන්ඩගෙකැල්ල සහ වැලිපනේවත්ත; බටහිරට: කැබලි අක්ෂර ඒ, මලවි ආරච්චිගේ විජේසේකර හිමිකම් කියන වැලිපනේවත්ත සහ නම්බු හේවා තිලකසිරි හිමිකම් කියන සෙංකුන්ඩගෙකැල්ල.

05 – 344

---

## ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

2015 අංක 47 දරන ආඥාව

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයට යටත්ව අංක 1904/36 හා 2015.03.04 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2015 අංක 47 දරන ආඥාවෙහි ඉඩමේ විස්තරයෙහි කො. 9243 දරන මූලික පිඹුරෙහි දිනය ලෙස සඳහන් කර ඇති 2012.08.30 වෙනුවට එම දිනය 2012.09.27 ලෙස ඇතුලත් වන පරිදි ගැසට් පත්‍රය සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

එම්. කේ. ඒ. ඩී. එස්.ගුණවර්ධන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: එල්ඩී/05/2008/එච්ඩබ්/19.
2015 අප්‍රේල් මස 23 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

05 - 212

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.